## ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වැවක් සාදයි

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා සුළු ගොවි අංශයේ පවත්නා සමාජ ආර්ථික ගැටළු අධ්‍යයනය කර ඒවාට විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා ජාතික මට්ටමෙන් පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයි "ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය"

එහි අධ්‍යයන කටයුතු වල නව උපනතියකට මුල් පියවර තබමින් ක්‍රියාන්විත පර්යේෂනයක් වශයෙන් එය නොදියුණු ගම්වල කුඩා වැව් පුනරුත්ථාපනය කිරීමේ කාර්යය ඉටු කිරීමේ අදාළ කටයුතු වල 1992 සිට නිරත විය.

එම කාර්යයේ නිරතව් සිටියදී සහභාගීත්ත්ව නිරීක්ෂණ ක්‍රමය යටතේ එම ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීන් දෙදෙනකු ලද අත්දැකීම් වෙන වෙනම මේ යටතේ විග්‍රහ කෙරේ.

# කැලේගම ව්‍යාපෘතියේ ලද අත්දැකීම් වලින් බිඳක්

නමට උචිත ලෙස සෑම අංශයකින්ම ඉතා නොදියුනු දුප්පත් ජනතාවක් වාසය කරන වියලි කලාපයේ ගල්ගමුවට ආසන්නව පිහිටා ඇති ගමකි. කැලේගම. දුගී භාවයේ පැවතිය ද සම්පත් අතින් එම ගම පෝෂිතය. ඉතා අතීතයේ දි ගොඩනංවන ලද කුඩා වැව් හයක් ගම වටා පිහිටා ඇති අතර. ඒ එක් එක් වැව යටතේ කුඹුරු යායක් ද වෙයි. ඒට අමතරව කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය ගොඩ ඉඩම් විශාල ප්‍රමාණයකුත්. තිසි මාර්ගෝපදේශකත්වය කින් දියුනු වේ මගට ගෙන ආ හැකි ජනතාවකුත් වාසය කිරීම මෙහිවැදගත් කම තවදුරටත් තීව්‍ර කරයි.

මෑත කාලයේ දී කිසිම පුනරුත්ථාපනයක් නොකළ නිසා කාලයත් සමග වනයෙන් වැසී බැම් කැඩී බිඳී දුර්වල වී පැවති කැලේගම, පාළුගම, හපුකුඹුර, ඉහලගම, කුඩා වැව සහ පුපුලවැටිය යන නම් වලින් හඳුන්වන වැව් හය පුනරුත්ථාපනය කිරීමෙන් මහ කන්නයේ වී වගාව සහ යල් කන්නයේ අතිරේක ආහාර බෝග වගාවන් මගින් කෘෂිකර්මය නංවාලීමත්, ස්වයං රැකියා මාගී බිහිකර ජනතාවගේ සේවා වියුක්තිය අඩුකොට ආදායම් තත්වය නංවා ලීම, ප්‍රජා වන වගාව තුළින් අතීතයේ දී මෙන් ගස් ගොම්මන යලි ඇතිකොට පරිසරය සංරක්ෂණය කිරීම, මානව සම්පත් සංවර්ධනය තුළින් ජනතාවගේ ඵලදායිත්වය ඉහළ

නැංවීමත් යන පුළුල් පරමාර්ථ අරමුණු කොටගත් ක්‍රියාන්විත පර්යේෂනයක් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් මෙම ගමෙහි ආරම්භ කරනු ලැබීය. මේ ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගනු ලැබුයේ ජනසවිය භාරකාර අරමුදල මගිනි.

මෙම පරමාර්ථ අදියර කීපයක් යටතේ ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති අතර, පළමුවෙන් කරනු ලැබුයේ වැව් හය පුනරුත්ථාපනය කිරීමේ කාර්යයි. දිගු කලක් කැළෑවෙන් වැසී තිබූ වැව් බැම් එළිපෙහෙළි කොට මුල් ගලවා අවශ්‍ය ස්ථාන වලට පස් පුරවා පිඩලි අල්ලා ශක්තිමක් කිරීම, අළුත් සොරොව් ඉදිකර සොරොව් දොරවල් සවි කිරීම, පිටවාන අවශ්‍ය පරිදි සැකසීම, නාන තොටුපොලවල් ඉදි කිරීම, වැව් බැම්මේ ආරක්ෂාව සඳහා වූ බිම් තීරුව (තට්ට කඩුව) යලි සැකසීම යන කාර්යයන් මේ අනුව කරනු ලැබීය. ගොවි කටයුතු පර්යේෂන හා පුහුණු කිරීමේ ආයතනයෙන් පැමිණ කැලේගම නේවාසිකව සිටිමින් මෙම ව්‍යාපෘතියේ වැඩ කල කීපදෙනා අතර, එක් අයෙකු වශයෙන් කැලේගම ජනතාව සමග වැඩ කිරීමේ දී ලද අත්දැකීම් සහ ඒ හා සම්බන්ධ වූ පසුබිම මා දකින ආකාරයට මෙහි සඳහන් කිරීම අරමුණයි.

වැව් පුනරුත්ථාපන කාර්යයේදී වැව් වල ඉදි කිරීම් කාර්යයන් හි වැඩ කිරීම සඳහාත්, වැව පරීක්ෂා කිරීම සඳහාත් යොදා ගනු ලැබුයේ මෙම වැව් යටතේ කුඹුරු වගා කළ ගමේ ජනතාවමයි. ඒ සඳහා කම්කරුවෙකුට දිනකට රු.75/- ක් සහ, වඩු හෝ මේසන් කාර්මිකයෙකුට දිනකට රු. 125/- ක ගෙවීමක් කරනු ලැබීය.

මෙම ජනතාව සමග වැඩ කිරීමේ දී පෙනී ගියේ ඔවුන් දිනකට පැය අටක් වැඩ කළයුතු වූවත් වැඩි දෙනෙක් අවංකවම එම නියමිත පැය ගණන වැඩ නොකළ බවයි. ඒ නිසා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වූ දින ගණනට වඩා වැඩි මිනිස් දින ප්‍රමාණයක් වැය විය. ඔවුන් වැඩ කළේ මුදල් බලාපොරොත්තුවෙන් ම නිසා වැඩ අවසන් කළයුතු වේලාව වූ ප. ව. 4.00 වන විටම වැඩ අවසන් කරනු ලැබීය. දිනක දීමනාව වූ රු. 75/- ප්‍රමාණවත් නැතැයි පවසමින් එය වැඩි කරන ලෙස ඉල්ලා සිටීම, උදළු, කුඩ, තාච්චි වැනි වැඩ කිරීමට අවශ්‍ය උපකරණ සපයා නොගැනීමත්, ඒවා සපයන මෙන් ගොවි කටයුතු පර්යේෂන හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා සිටීමත් යන ප්‍රධාන ගැටළු වලට මුහුණ දෙමින්ම ව්‍යාපෘතියේ පළමු අදියර වූ වැව් පුනරුත්ථාපන වැඩ අවසන් කරගත හැකි විය.

පැහැදිලිවම දන්නා පරිදි මෙවැනි වයසීවක් මෙම ජනතාව තුළින් දිස්වීමට හේතු වූ කරුණු රාශියක් ඇති බව සඳහන් කළ යුතුය. ව්‍යාපෘතියේ වැඩ කළ ජනතාවගෙන් බහුතරයක් ඉතා අඩු අධ්‍යාපන මට්ටමක් ඇති අය විය. වැඩිමහල්ලන් පමණක් නොව නව පරපුරේ තරුණයින් කීප දෙනෙක් ද අකුරු ලිවීමට නොදත් අය වූ අතර, ඔවුන් සිය දීමනාව ලබා ගත්තේ ද ඇඟිලි අත්සන තැබීමෙනි. මෙවැනි අඩු අධ්‍යාපන මට්ටමක සිටින ජනතාවකට පුළුල් ලෙස හිතා මතා වැඩ කිරීමේ හැකියාව අඩුය. එනිසා ඔවුන්ට ව්‍යාපෘතිය පිළිබඳව පැහැදිළි අවබෝධයක් නොමැති විය. තමන්ගේ ජීවන තත්වයන් උසස් කිරීමට හේතුවන හා විය හැකි ව්‍යාපෘති මොනවා දැයි ස්වාධීනව සිතා මතා ප්‍රකාශ කිරීමට හෝ ඒවා තෝරා බේරා ගැනීමට හැකියාවක් ඔවුනට නොමැත. අඩු අධ්‍යාපන මට්ටම හා බැඳි දූරවබෝධය නිසා ඔවුනට ලැබෙන සම්පත් සිය අභිවෘද්ධිය සඳහා හසුරුවා ගැනීමට තරම් ශක්තියක් නොමැත.

ගමේ ජනතාවගෙන් වැඩිම පිරිසක් ඉතා දිළිඳු මට්ටමේ පසුවේ. මේ නිසා ඔවුන්ගේ ප්‍රධානතම බලාපොරොත්තුව තම දරු පවුල් නඩත්තු කර ගැනීමට මුදලක් උපයා ගැනීමය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ජූලි, අගොස්තු යන මාස මෙම ප්‍රදේශවලට දැඩි නියඟ පවත්නා කාලයක් වන අතර මේ කාලය වසරේ ජීවත්වීමට අසීරුම කාලය ලෙස හැඳින් වූවද වරදක් නැත. මේ කාලයේ ගමේ ජනතාවට කිසිදු වගාවකින් හෝ වෙනත් රැකියාවකින් හෝ ආදායම් නොලැබෙයි. ඒ නිසා වැව් ව්‍යාපෘතියේ වැඩ කිරීමෙන් දිනකට ලැබුණ රු. 75/- ක මුදල ඔවුන්ගේ ජීවිත පවත්වා ගෙන යෑමට තිබූ එකම ආදායම් මාර්ගය විය. මේ නිසා මෙම ජනතාව හෙමින් වැඩ කළ අතර, මුදල් වලින් තොරව කිසිම වැඩක් කිරීමට හෝ නියමිත කාලයට වඩා වැඩියෙන් වැඩ කිරීමට හෝ ඉදිරිපත් වූයේ නැත. වැව පුනරුත්ථාපනය කොට කෘෂිකර්මය නංවාලීම පමණක්ම ඔවුන්ගේ ප්‍රශ්ණ වලට එකම විසඳුම නොවීය. වැව සෑදීම ඔවුන්ගේ ප්‍රශ්ණ සම්භාරයෙන් එකක් පමණි. මේ නිසාද ජනතාව තමන්ට පුරුදු විවේක පාඩුවේ වැඩ කිරීම කළහ. ඔවුන්ගේ ජීවිත හැඩ ගැසී ඇත්තේ හේන, කුඹුර සහ බැඳුණු ඉතාසරල රටාවකටය. ඒ සඳහා එතරම් කඩිසර කමක් අවශ්‍යවූයේ ද නැත. විවේක පාඩුවේ හෙමින් වැඩ කොට ඒවායින් ලැබුණු සුළු අස්වනු ප්‍රමාණයෙන් තම පවුල් යම්තම් ජීවත් කරගෙන යාම ඔවුන්ගේ ජීවන ක්‍රමය විය. දියුණුවීමේ අපේක්ෂා මොවුන් තුළ පැවතිය ද ඒ සඳහා ක්‍රියාකළ යුත්තේ, සම්පත් හැසිරවිය යුත්තේ කවර අකාරයකට දැයි ඔවුනට දැනුමක් තේරුමක් නොතිබුණි. මීට කලින් රජයේ හෝ රජයේ නොවන සංවිධානයකින් මෙවැනි ව්‍යාපෘති මෙම ගම තුළ ක්‍රියාත්මක කර නොතිබූ නිසා මෙවැනි ව්‍යාපෘතියක වැඩ කිරීම පිළිබඳ පෙර ලැබූ පුහුණුවක් ද නොමැති හෙයින් ඔවුන් මෙම ව්‍යාපෘතියේ දී වැඩ කළේ සිය ස්වභාවික ගති හැසිරීම් රටාවට අනුවමය. මෙසේ සිය සමාජ ව්‍යූහය තුළම පැවති මෙවැනි දුර්වලතාව යන් හේතුකොට ගෙන සම්ප්‍රදායි චින්තන රටාවකට සීමා වී ජීවත් වන මොවුන් හට ව්‍යාපෘතිය කින් නිසි ඵල ප්‍රයොජන ලබා ගැනීමට හෝ ඒවා පිළිබඳ පුළුල් ලෙස සිතා බැලීමට වුවමනාවක් හෝ හැකියාවක් හෝ සංවිධාන ශක්තියක් හෝ නොතිබුණ බව මගේ හැඟීමයි.

වැව් බැම් හෙළි පෙහෙළි කර ඒවා ශක්තිමත්ව ගොඩ නගා සොරොව් ඉදි කිරීම නිසා මහ කන්නයේ දි ඉතා පහසුවෙන් හා ක්‍රමවත්ව සිය වගා බිම් වලට ජලය සපයා ගත හැකි විය. මෙම වැව් 6 න් වැඩිම ප්‍රමාණයක් රඳා පවතින පුපුලවැටිය වැව ගැන අදහස් දක්වන එම වැව් යටතේ වූ ගොවීන් පුනරුත්ථාපනයෙන්පසුව වැව ගැන බියවීමට කිසිදු හේතුවක් නොමැති බව පවසයි. පුනරුත්ථාපනය කිරීමට පෙර මහ කන්නයේ වර්ෂාවෙන් වැව පිරී ඉතිරී යන රාත්‍රි කාලයේ දී වර්ෂාවට තෙමෙමින් නිදි නොමැතිව වැළි ගෝනි එකතු කරමින් දුර්වලව පැවති වැව් බැම්ම නොකැඩී රැක ගැනීමට බොහෝ වෙහෙස මහන්සි වූ ආකාරය සිහිපත් කරන ගොවීන් වර්තමාන තත්ත්වය ඉතාමත්ම සතුටු දායක බව පවසයි. සෙසු වැව් වලද තත්ත්වය එලෙසමය. ගොවීන්ගේ ඉල්ලීම මත පිට වාන් අවශ්‍ය ආකාරයට ඉදි කිරීම නිසා පෙර මෙන් වැව් වාන් දැමීමේ දී ඔවුන්ගේ වගාවන් පාළු වන්නේ නැත. නාන තොටු පොලවල් හැම වැවකම ඉදි කල නිසා වැවෙන් දියනෑම වැනි කාර්යයන් සඳහා මහත් පහසුවක් සැළසී තිබේ. මෙම ප්‍රදේශයේ ජනතාවට ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් වන යල් කන්නයේ ජූලි, අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් යන මාසවල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා ව්‍යාපෘතියේ වැඩ කිරීමෙන් ඔවුන් දිනකට රු. 75/- ක මුදල් උපයා ගැනීම ඔවුන්ගේ දරු පවුල්වල පරිභෝජන අවශ්‍යතා ඉටු කර ගැනීමට මහත් පිටවහලක් විය. ව්‍යාපෘතියට සම්බන්ධ වූ පිරිසෙන් වැඩි දෙනෙකු දුප්පත් කමේ පහළම අඩියේ ජීවත් වූවත් නිසා ඔවුන්ට ලැබුන මෙම මුදල් සියල්ලම පරිභෝජනයට යෙදවූ අතර, ඉතා සුළු පිරිසක් පමණක් මුදල් ඉතිරිකර පාපැදි කැසට් රේඩියෝ වැනි භාණ්ඩ මිළට ගත් අතර එක් පුද්ගලයකු මීට පෙර මුදල් අවශ්‍යතාවයක් සඳහා උකස් කර තිබූ කුඹුරේ උකස් බේරා ගෙන ඇත. ව්‍යාපෘතියේ පළමුවන අදියර නිම කිරීමෙන් ගොපපු

ආයතනය ලද වැදගත්ම ඵලය ලෙස සඳහන් කළ හැක්කේ එම කටයුතුවලදී ලද වැදගත් අත්දැකීම්ය. එය ගොපපු ආයතනය කළ වැදගත් අධ්‍යයනයක් වේ. 'සහයෝගිතා සංවර්ධන' යන සංකල්පය සාක්ෂාත් කර ගැනීම බෙහෙවින් අසීරු කටයුත්තක් බව මෙයින් පැහැදිලිවම ඔප්පු වෙයි. විශේෂයෙන්ම දරිද්‍රතා කඩඉමටත් පහළ ජීවන මට්ටමක් උරුම කරගත් ජනතාවක් වාසය කරන ගම්වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සහයෝගිතා සංවර්ධනයක් බලාපොරොත්තු වීම අතිශයින්ම අසීරු කටයුත්තකි. එසේම මේ හේතුව නිසාම මෙම ගම් සංවර්ධනය නොකළ යුතු යයි ප්‍රකාශ කළ නොහැක. කැලේගමින් ලද අත්දමේ අත්දැකීම් වලට මුහුණ පාමින් හෝ එම දුප්පත් ජන කොටස් නගා සිටුවීමට ක්‍රියා කිරීම ජාතික වශයෙන් වැදගත් මෙහෙවරකි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය තුළින්ම කල් යෑමේ දී ජනතාව තුළ යම් පරිචයක් හා දැනුවත් වීමක් ඇති කරවීම මගින් මෙම දුර්වලතා ක්‍රමයෙන් මගහැර ගැනීමට ද හැකි බව මගේ විශ්වාසයයි.

ව්‍යාපෘතියේ දී මට පෙනී ගිය වැදගත්ම කරුණක් වූයේ ජනතාවට වැව් සාදා ගැනීම අවශ්‍ය වූවා සේම ඊටත් වඩා අවශ්‍ය වී ඇත්තේ ආදායම් උපයන මාර්ගයි. මේ සඳහා ප්‍රදේශට ගැලපෙන කෘෂි කාර්මික සහ කෘෂිකාර්මික නොවන ව්‍යාපෘති කවරේදැයි තෝරාබේරා ගෙන ක්‍රියාත්මක කළ යුතුය. වැව් පුනරුත්ථාපනය කිරීමෙන් ඊට මහත් පිටවහලක් ද සැළසී ඇත. ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ආදායම් උපයන ව්‍යාපෘති සඳහා අවධානය යොමු කරන බැවින් එම අවශ්‍යතාවය සපිරෙනු ඇත.

මෙවැනි ගම්බද සමාජවල සමාජ ව්‍යුහයේම පවතින දුර්වලතා නිසා සංවර්ධනය යන්න ගැමියා තුළින් නිරායාසයෙන්ම ඇති වන්නේ නැත. ඒ සඳහා බාහිර උත්ප්‍රේරක මාධ්‍යයක මැදිහත් වීම අත්‍යාවශ්‍ය වෙයි. එවැනි බාහිර උත්ප්‍රේරක මාධ්‍යයක් වශයෙන් ගොපපු ආයතනය මැදිහත් වී මේ ජනතාව සංවර්ධනය දෙසට කැඳවා ගෙන යා යුතුය. ගොපපු ආයතනය සිය සීමාවන් පුළුල් කරමින් රජයේ වත් රජයේ නොවන සංවිධානවල වත් අවධානය යොමු නොවූ මෙවැනි අන්ත දිළින්දන් වාසය කරන ගම්මානවල සැබෑ සංවර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කිරීම ප්‍රශංසනීය වූවකි. ඒ සඳහා කැලේගම ව්‍යාපෘතියේ අත්දැකීම් වලින් ලැබිය හැකි ආලෝකය ද ඉමහත් බව මගේ හැඟීමයි.

*ආර්. එල්. නිමල් ජයතිස්ස*
පර්යේෂන හා පුහුණුකිරීමේ නිලධාරි.